# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,508 - 2026 සැප්තැම්බර් මස 25 වැනි සිකුරාදා - 2026.09.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


*සැ. යු.* - (i) විසර්ජන පනත් කෙටුම්පත 2026 සැප්තැම්බර් මස 18 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත 2026 සැප්තැම්බර් මස 18 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ඔක්තෝබර් මස 16 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ඔක්තෝබර් මස 02 වැනි දින (දහවල් 12. 00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1 - B 082834 — - (2026/09)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### 'දිට්වා' ව්‍යවසනයෙන් ආපදාවට ලක් වූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරින් බඳවා ගැනීම - 2026

දිට්වා ආපදා තත්ත්වය මත ඌව පළාතේ හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා පහත විස්තර සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| ඌව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) | 12 |
| ඌව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැළසුම් ශිල්පී | 04 |

1. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය - **2026.10.07**

2. පොදු කොන්දේසි :

2.1 අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2.2 2026.10.07 දිනට වයස අවුරුදු 18 ට වැඩි අවුරුදු 45ට නොවැඩි විය යුතුය.විශ්‍රාමික නිලධාරින් අයදුම් කරන්නේ නම් උපරිම වයස අවුරුදු 67 කි.
2.3 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පදිංචි අයදුම්කරුවෙකුට මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමේ හැකියාව පවතී.
2.4 යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මේ සඳහා අයදුම් කළ නොහැක.
2.5 සේවයට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
2.6 සෑම අයදුම්කරුවෙකුම ඌව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. (විශ්‍රාමික නිලධාරින් අයදුම්පත් යොමු කිරීමේදී සේවයේ යෙදවීමට සුදුසු සෞඛ්‍ය මට්ටමක් පවතින බවට රජයේ පිළිගත් වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)
2.7 විශ්‍රාමික නිලධාරින් කොන්ත්‍රාත් පදනම මත අයදුම් කිරීමේදී පහත සුදුසුකම් අදාළ නොවන අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි සඳහන් සුදුසුකම් මත අයදුම් කළ යුතුය.

3. සුදුසුකම් - විශ්‍රාමික නොවන නිලධාරින් සඳහා

3.1 අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ( 2026.10.07) දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|
| ඌව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) කොන්ත්‍රාත්<br>(පුරප්පාඩු සංඛ්‍යාව 12 කි) | සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;<br>*හා*<br>01. භෞතික විද්‍යා විෂයය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත්වීම;<br>*හෝ* | I. මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) ;<br>*හෝ*<br>II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (NDES) ;<br>*හෝ* |

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|
| ඌව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැළසුම් ශිල්පී කොන්ත්‍රාත් (පුරප්පාඩු සංඛ්‍යාව 04 කි) | 02. ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයන් දෙක සහිතව විෂයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත්වීම.<br><br>(සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) | III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE) ;<br>*හෝ*<br>IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ;<br>*හෝ*<br>V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම ;<br>*හෝ*<br>VI. රැකියා ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතා NVQ 06 මට්ටමට සමාන සුදුසුකම් ලබා තිබීම ;<br>*හෝ*<br>VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

4. *ඉදිරිපත් කළ යුතු ලේඛණ* :

4.1 මෙහි ඇමුණුම් අංක 1 මඟින් දක්වා ඇති අයදුම්පත්‍රය (විශ්‍රාමික නිලධාරීන් අයදුම් කිරීමේදී රා.ප.ච. 03/2018 හි අදාළ අයදුම්පත),
4.2 උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක්,
4.3 ජාතික හැඳුනුම්පතේ සහකිත කළ පිටපතක්,
4.4 අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත්,
4.5 වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතිකවල සහතික කරන ලද පිටපත්.

5. *බඳවා ගැනීමේ විධිවිධාන :*

අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව ලැබෙන අයදුම්පත් ප්‍රමාණය පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු ප්‍රමාණයක් නම් සුදුසුකම් පරික්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක්ද, ලැබෙන අයදුම්පත් ප්‍රමාණය පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩිනම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්ද කොන්ත්‍රාත් පදනමින් මෙම තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

6. *සේවා කොන්දේසි :*

6.1 දිට්වා ආපදා තත්වය මත ඌව පළාතේ හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අතිරේක කාර්යය මණ්ඩලය සඳහා පමණක් කොන්ත්‍රාත් පදනමින් මෙම බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

6.2 වසරක කාලයක් සඳහා පමණක් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා අතර, අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී මෙම කොන්ත්‍රාත් පත්වීම අහෝසි කිරීමේ බලය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

6.3 මෙම තනතුරු සඳහා ඉල්ලුම් කරන සියලුම අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගැනීම අනිවාර්යයෙන් සිදු කරන බවට නොසැලකිය යුතුය.

07. *වැටුප් පරිමාණය :*

7.1 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරු සඳහා 2025.03.25 දිනැති 10/2025 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව MN-3-2025 වැටුප් පරිමාණයේ උපලේඛණ II හි සඳහන් ආරම්භක වැටුප් පියවර වන රු. 52,250/- සමාන දීමනාව ගෙවනු ලබන අතර, එහෙත් ඔබට ගෙවීම් කරනු ලබන්නේ උපලේඛණ III හි සඳහන් පරිදි වේ. ඔබගේ කොන්ත්‍රාත් දීමනාව සමඟ ජීවන වියදම් දීමනාව රු 17,800/- ද එකතු කර ගෙවනු ලැබේ.

7.2 විශ්‍රාමික නිලධාරින් සඳහා ගෙවීම් කිරීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 විධිවිධාන ප්‍රකාරව ගෙවීම් කරනු ලැබේ.

08. අයදුම්පත්‍රය ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කර 2026.10.07 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ 'ලේකම්, ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පීලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. අයදුම්පත් ලැබුණු බවට දන්වනු නොලැබේ. ලිපි කවරයේ වම්පස ඉහල කෙලවරේ **දිට්වා ආපදා තත්වය මත ඌව පළාතේ හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය** ලෙස සඳහන් කළ යුතු අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. මෙම නිවේදනයෙන් ආවරණය වන/නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය ගැනීමේ අයිතිය මෙම කොමිෂන් සභාව සතු වන අතර, මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණය කිරීමද මෙම කොමිෂන් සභාව සතුවේ. තවදුරටත් පැහැදිළි කර ගැනීමට යම් කරුණක් වෙතොත් කාර්යාල වේලාව තුල අංක 0552222400 දුරකතන අංකය අමතා දැන ගත හැකිය.

10. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල පාඨය බලපැවැත්වේ.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

එල්.ඒ. සෝමරත්න,
ලේකම්,
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2026 සැප්තැම්බර් මස 14 වැනි දින.

**ඇමුණුම් 01**

ආදර්ශ අයදුම්පත්‍රය

***දිට්වා ආපදාවෙන් හානියට පත් වූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරින් බඳවා ගැනීම - 2026***

තනතුර - 

පදිංචි දිස්ත්‍රික්කය - 

01. 1.1 මුලකුරු සමඟ නම - ..............................................................................................................................
Mr./Mrs./Miss (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උදා.- SILVA A.B.C.)

1.2 මුලකරු සමඟ නම - ..........................................................................................................................................
මයා/මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
..........................................................................................................................................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්/දෙමළෙන්)
..........................................................................................................................................

02. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
..........................................................................................................................................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්)
..........................................................................................................................................

2.3 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.4 ස්ත්‍රී/ පුරුෂ භාවය : 0 - පුරුෂ 1- ස්ත්‍රී

| |
|---|
| |

03. 3.1 උපන් දිනය :

| Y | Y | Y | Y | M | M | D | D |
|---|---|---|---|---|---|---|---|

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2026.10.07) වයස - අවු. :.................. මාස :.................... දින :.................

3.3 දුරකථන අංකය : ජංගම

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

ස්ථාවර

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

3.4 විද්‍යුත් තැපැල් ලිපිනය (email) :……………………………………………...........………………

04. විවාහක/අවිවාහක බව : අවිවාහක - 1 විවාහක - 2

| |
|---|
| |

**05.** අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :.............................................................................................

06. අධ්‍යාපන සුදුසුකම් :

6.1 අ.පො.ස. (සා.පෙළ) :

වර්ෂය - .................................
විභාග අංකය - .................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

6.2 අ.පො.ස. (උ.පෙළ) :

වර්ෂය - ................................
විභාග අංකය - .................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

07. *වෘත්තීය (තාක්ෂණ) සුදුසුකම් :*

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | පාඨමාලාව වලංගු දිනය | NVQ මට්ටම | NVQ සහතිකයේ අංකය | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |

08. *අයදුම්කරු විසින් ඉල්ලුම් කරන ලද තනතුරට අදාළව කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර :*

| ආයතනයේ නම | දැරූ තනතුර | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

09. ඔබ කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා ඇද්ද - ..........................................................................
ඔව් නම් විස්තර සඳහන් කරන්න. - ..........................................................................

10. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් හා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම අවසන් කිරීමට යටත් වන බවත් මා දනිමි. තව ද මෙම කොන්ත්‍රාත් පදනමින් සිදු කරන මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නිති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කර සිටිමි.

.......................... ...................................,
දිනය අයදුම්කරුගේ අත්සන.

11. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................................................................... ලිපිනයේ පදිංචි .............................. දරන ජාතික හැඳුනුම්පත් අංක දරන ....................................................................... මහතා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

(*සටහන*.- සෑම අයදුම්කරුවෙකුම තම අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියෙකු, සාමදාන විනිශ්චයකාරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රු. 854,880.00 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.)

................................ .........................................
දිනය සහතික කරන්නාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

සහතික කරන්නාගේ සම්පූර්ණ නම - .....................................................................................
තනතුර - .....................................................................................
ලිපිනය - .....................................................................................

09-269

## වයඹ පළාත් සභාව

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා පත්කිරීමට, වයඹ පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය සහ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි නියුතු ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය පරිපාලන 1 ශ්‍රේණියේ නිලධාරින්ගේ දීපව්‍යාප්ත මට්ටමින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *යෝග්‍යතා :*

1.1 සාමාන්‍ය සුදුසුකම් :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
iii. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිළධරයන් වෙතින් අයදුම්පත් කැඳවන බැවින් වයස් සීමාව අදාළ නොවේ.

1.2 *සුදුසුකම්* :-

i. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන 1 ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.
ii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙහි විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

*සැලකිය යුතුයි.-* ඉහත 1.2 (i) හි සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් ඉදිරිපත්ව නොමැති නම් පමණක් ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන 1 ශ්‍රේණියට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් වැඩ බැලීමේ හෝ රාජකාරි ඉටු කිරීමේ පත්වීමක් සඳහා සලකා බලනු ලැබේ.

1.3 සෑම අයදුම්කරුවකුම 2026.10.16 දිනට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

*සටහන :* අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට මෙම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු අතර ඉහත සඳහන් සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහ ජාතික හැඳුනුම්පතේ තමා විසින් සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

02. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :-

සියලුම අයදුම්පත් (ආදර්ශ අයදුම්පත්‍රය www.psc.nw.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය.) විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර **2026.10.16 දින හෝ ඊට පෙර** ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මගින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතු ය.) "ආණ්ඩුකාරවර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය, මාලිගාව, කුරුණෑගල" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතු ය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය විසින් භාර ගනු නොලැබේ.

03. *තෝරා ගැනීමේ ක්‍රමය :-*

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමේ පටිපාටියට අනුව (ඇමුණුම 1) ලකුණු ලබාදීම සිදු කරනු ලැබේ.
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේ දී සහභාගි නොවන අයදුම්කරුවන් සඳහා වෙනත් දිනයක දී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී පවත්වනු ලැබේ.

- තම සුදුසුකම් සනාථ කිරීමට අදාළ සියලු ලියකියවිලි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන දිනයේ දී ම ඉදිරිපත් කළ යුතු ය. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ඉල්ලා ඇති නමුත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතික සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.

- වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව වයඹ පළාත් ආණ්ඩුකාරවර ලේකම් විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී, ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

*සැලකිය යුතුයි -*

- මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරයා සතුවේ.

- මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුවේ.

- මෙම තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරයා සතු වේ.

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි,

ආණ්ඩුකාරවර ලේකම්,
ආණ්ඩුකාරවර කාර්යාලය,
වයඹ පළාත.

2026 සැප්තැම්බර් මස 14 වැනි දින.

**වයඹ පළාත් ආයුර්වේද කොමසාරිස් (පරිපාලන I) තනතුරට පත් කිරීමට අදාළ ලකුණු ලබා දීමේ පටිපාටිය -2023 (සංශෝධිත)**

| *නිර්ණායක* | *ලකුණු ලබාදෙන ආකාරය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01. ජ්‍යෝෂ්ඨතාවය | (අ) පරිපාලන I ශ්‍රේණියේ සේවා කාලය සඳහා වසරකට ලකුණු 10 බැගින් | 09 |
| | (ආ) පරිපාලන II ශ්‍රේණියේ සේවා කාලය සඳහා වසරකට ලකුණු 06 බැගින් - | |
| | (ඇ) ආයුර්වේද වෛද්‍ය සේවයේ වෛද්‍ය නිලධාරි I ශ්‍රේණියේ සේවා කාලය සඳහා වසරකට ලකුණු 04 බැගින් - | |
| | (ඈ) ආයුර්වේද වෛද්‍ය සේවයේ වෛද්‍ය නිලධාරි II ශ්‍රේණියේ සේවා කාලය සඳහා වසරකට ලකුණු 02 බැගින් - | |
| | (සේවා කාලය ගණනය කිරීමේ දී වසරකට අඩු සේවා කාලයක් සපුරා ඇති විටෙක මාස 06 ක් හෝ ඊට වැඩි කාලයකට වසරකට හිමි ලකුණු ප්‍රමාණයෙන් අර්ධයක් හිමිවේ.) | |
| | **සටහන :-**<br>ඉහත (අ) යන්නට අදාළ සුදුසුකම් සහිත නිලධාරීන් අයදුම්කර නොමැති නම් පමණක් (ආ) සුදුසුකම් සහිත නිලධාරීන් ද එම නිලධාරීන් නොමැති නම් (ඇ) සුදුසුකම් සහිත නිලධාරීන් ද එම නිලධාරීන් නොමැති නම් (ඈ) සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පිළිබඳව ද පිළිවෙලින් සලකා බලනු ලැබේ. | |

<table>
<tr><th>නිර්ණායක</th><th>ලකුණු ලබාදෙන ආකාරය</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td rowspan="1">02. ආයුර්වේද ක්ෂේත්‍රයට අදාළ වෙනත් අධ්‍යාපන සුදුසුකම්<br><br>(ආයුර්වේද වෛද්‍ය සේවයේ වෛද්‍ය නිලධාරි I වන ශ්‍රේණියට උසස් වීමේ දී හෝ මෙම තනතුරට අයදුම් කිරීමේ දී මූලික සුදුසුකමක් ලෙස ඉදිරිපත් කරන සහතිකය හැර)</td><td>ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ II පරිශිෂ්ඨයේ ඇතුළත් විෂයයන් සම්බන්ධව -<br><br>(අ) PG (පශ්චාත් උපාධි ඩිප්ලෝමා) - (ලකුණු 07)<br>(ආ) MSC (විද්‍යාපති) - (ලකුණු 10)<br>(ඇ) Mphill (දර්ශනවේදී) - (ලකුණු 12)<br>(ඈ) PHD (දර්ශනපති) - (ලකුණු 15)<br><br>• ඉහළම සුදුසුකම ඇති එක් සහතිකයකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>• මූලික සුදුසුකමේ දී සළකා බලන ලද රෝහල් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියට ඉහළ සුදුසුකමක් සපුරා ඇත්නම් පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.</td><td rowspan="2">15</td></tr>
<tr><td rowspan="2">03. කාර්යය සාධන ඇගයුම</td><td>සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට පෙර පූර්වාසන්න වසර 05ක කාල පරිච්ඡේදයක් තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයුමේ දී ලබා ගත් ඇගයුම් අනුව පහත දක්වා ඇති පරිදි ලකුණු ලබා දෙනු ඇත.</td></tr>
<tr><td><table>
<tr><th>කාර්ය සාධන ඇගයුමේ දී ලබා ගත් ඇගයුම්</th><th>වසරක් සඳහා ලබාදෙන උපරිම ලකුණු</th></tr>
<tr><td>විශිෂ්ඨයි</td><td>ලකුණු 03</td></tr>
<tr><td>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ</td><td>ලකුණු 2.5</td></tr>
<tr><td>සතුටුදායකයි</td><td>ලකුණු 1.5</td></tr>
</table></td><td>15</td></tr>
<tr><td>04. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළව පළකර ඇති ප්‍රකාශන</td><td>ජාත්‍යන්තර මට්ටමේ සඟරාවල ශාස්ත්‍රීය පර්යේෂණ/ප්‍රකාශන හෝ ශ්‍රී ලංකා ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලයේ අනුමැතිය සහිත ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ සඳහා - (ලකුණු 2.5 බැගින්)<br><br>• පශ්චාත් උපාධිය හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා ලකුණු ලබා දුන් ශාස්ත්‍රීය ග්‍රන්ථ/නිබන්ධන සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.</td><td>05</td></tr>
<tr><td>05. ලබාගත් පුහුණු (දේශීය/විදේශීය)</td><td>(අ) ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය හෝ සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව හෝ සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ හෝ දින 05කට වැඩි දින 14කට අඩු පුහුණුවක් සඳහා (ලකුණු 01 බැගින්)<br><br>(ආ) ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය හෝ සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව හෝ සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ හෝ සති 02 ක් හෝ ඊට වැඩි පුහුණුවක් සඳහා - (ලකුණු 02 බැගින්)</td><td>05</td></tr>
<tr><td>06. වෙනත් සුදුසුකම්</td><td>භාෂා හැකියාව (මාධ්‍යය භාෂාව හැර වෙනත් භාෂාවක් සම්බන්ධයෙන් රජය පිළිගත් ආයතනයක් විසින් නිකුත් කළ පැය 100 ක් ආවරණය වන ඩිප්ලෝමා)-</td><td></td></tr>
</table>

| *නිර්ණායක* | *ලකුණු ලබාදෙන ආකාරය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| | (අ) අනෙක් රාජ්‍ය භාෂාව (සිංහල/දෙමළ) - (ලකුණු 2.5)<br>(ආ) සන්ධාන භාෂාව (ඉංග්‍රීසි) - (ලකුණු 2.5)<br><br>(රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා යොදාගත් සහතිකය හැර වෙනත් සහතික ඉදිරිපත් කළ යුතුය.) | 05 |
| 07. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | සම්මුඛ පරීක්ෂණය සඳහා පූර්ව සූදානම/කරුණු ඉදිරිපත් කිරීම/නගනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීම/සාමාන්‍ය හැසිරීම/සාමාන්‍ය අවබෝධය යන කරුණු සලකා බලනු ලැබේ. (ලකුණු 05) | 05 |
| මුළු ලකුණු | | 100 |

**ආදර්ශ අයදුම්පත්‍රය**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

| |
|---|
| |

***වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනීම***

**"අ" කොටස**

01. 1.1 මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) :........................................................................................................
.................................................................................................................................. මයා/මිය/මෙනවිය

1.2 මුලකරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) Mr./Ms./Mrs. :..................................................................................
.
.................................................................................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :.....................................................................................................
.................................................................................................................................................

1.4 ස්ත්‍රී/ පුරුෂ භාවය : ☐

ස්ත්‍රී - F  පුරුෂ - M (අදාළ සංකේතය කොටුව තුළ සඳහන් කරන්න.)

1.5 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐  මාසය : ☐☐  දිනය : ☐☐

1.6 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

02. 2.1 ස්ථිර පදිංචි ලිපිනය :.........................................................................................................................
.................................................................................................................................................

2.2 රාජකාරී ලිපිනය (සිංහලෙන්) :............................................................................................................
.................................................................................................................................................

2.3 දුරකථන අංකය : රාජකාරී :...................................................... පෞද්ගලික :..................................................

03. 3.1 වර්තමාන තනතුර :...................................................................................................

3.2 පන්තිය හා ශ්‍රේණිය :...................................................................................................

3.3 එම තනතුර සඳහා පත් වූ දිනය :...................................................................................................

3.4 වර්තමාන ශ්‍රේණියට පත් වූ දිනය :…...................................................................................................

3.5 2026.10.16 දිනට එම තනතුරේ සක්‍රීය සේවා කාලය :...................................................................................................

3.6 පූර්ව සේවා විස්තර :

| *අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය* | *කාල වකවානුව* | | *නිලධාරියා දැරූ තනතුර* | *තනතුර අයත් ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| | *දින සිට* | *දින දක්වා* | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

04. අධ්‍යාපන සුදුසුකම් :

(ආයුර්වේද වෛද්‍ය සේවයේ වෛද්‍ය නිලධාරි 1 වන ශ්‍රේණියට උසස් වීමේ දී හෝ මෙම තනතුරට අයදුම් කිරීමේ දී මූලික සුදුසුකමක් ලෙස ඉදිරිපත් කරන සහතිකය හැර ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ II පරිශිෂ්ඨයේ ඇතුළත් විෂයයන් සම්බන්ධව හදාරා ඇති/පශ්චාත් උපාධිය/විද්‍යාපති/දර්ශනවේදී/දර්ශනපති උපාධිය පිළිබඳ විස්තර)

4.1 පශ්චාත් උපාධියේ/පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ නම :...................................................................................................

4.2 විශ්වවිද්‍යාලය/ආයතනය :...................................................................................................

4.3 එම පශ්චාත් උපාධිය/පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සම්පූර්ණ කළ දිනය :...................................................................................................

05. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළව පළකර ඇති ප්‍රකාශන :...................................................................................................
...................................................................................................

06. ලබාගත් පුහුණු : දේශීය/විදේශීය :

| *ආයතනයේ නම* | *පුහුණුවේ නම* | *දේශීය/විදේශීය* | *කාලසීමාව* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

07. භාෂා හැකියාව :

(රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා යොදාගත් සහතිකය හැර පැය 100 ආවරණය වන ඩිප්ලෝමා)

...................................................................................................
...................................................................................................

08. අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ද, මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වූ බව ප්‍රකාශ කරමි.

දිනය :........................ ......................................,
අයදුම්කරුගේ අත්සන.

"ආ" කොටස

අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුව භාර ආසන්නතම මාණ්ඩලික නිලධාරියාගේ සහතිකය මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .....................................................................මයා/මිය/මෙනවිය

01.1.1 පූර්වාසන්නව වසර 05 තුළ සියලුම වැටුප් වර්ධන උපායාගෙන ඇත/නැත.

| වර්ෂය | වාර්ෂික වැටුප් වර්ධක උපායාගෙන ඇත/නැත | කාර්ය සාධන මට්ටම |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

1.2 වැටුප් වර්ධක විලම්භනය කර ඇතිනම් එසේ කිරීමට හේතුව සහ කාලසීමාව :....................................................................
.........................................................................................................................................................................

02. පූර්වාසන්න වසර 05 තුළ විනය කටයුත්තකට භාජනය වී ඇත/නැත
එසේ විනය කටයුත්තකට භාජනය වී ඇත්නම් ඒ පිළිබඳව තොරතුරු

| වර්ෂය | අදාළ විනය කටයුතු | එහි වත්මන් තත්වය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

(චෝදනා පත්‍ර/විනය නියෝග නිකුත් කර ඇත්නම් ඒවායෙහි සහතික කරන ලද පිටපත් ඇමිණීම අනිවාර්ය වේ.)

03. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවම් ලබා ඇත/නැත.

04. උසාවියකින් දඬුවම් ලබා ඇත/නැත

05. නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් යටතේ වන අවශ්‍යතාවයන් සපුරා ඇත/නැත

06. ඔහුගේ/ඇයගේ අයදුම්පතෙහි දැක්වෙන විස්තරය මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන සමඟ සැසඳෙන බව ද, සහතික කරමි/ නොකරමි.

දිනය :........................ ....................................................
මාණ්ඩලික නිලධාරියාගේ අත්සන.
නම :
නිල මුද්‍රාව :

"ඇ" කොටස

**ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :**

ඉහත සඳහන් තොරතුරු ඉදිරිපත් කර ඇති ........................................................................................................ නිලධරයාගේ/නිලධාරිනියගේ පෞද්ගලික ලිපි ගොනුව පරීක්ෂා කළ බවත්, ඒ අනුව එම තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර මෙම නිලධරයා/නිලධාරිනිය විසින් 2026.10.16 දිනට පූර්වාසන්න පස් වසරක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත්, එම කාලසීමාව තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, කිසිදු විනයානුකූල දඬුවමකට ලක් නොවූ බවත්, මෙම අයට විරුද්ධව යම් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් නොකරන බවත්, සහතික කරමි. මෙම තනතුර සඳහා නිලධරයා/නිලධාරිනිය තෝරා ගනු ලැබුවහොත් නිදහස් කිරීමට එකඟ වෙමි.

දිනය :.........................

............................................................,
ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

---

**අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :**

දිනය :.........................

..............................................,
අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන.
නම :
නිල මුද්‍රාව :

---

**පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :** (පළාත් සභාවට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන් සඳහා පමණි.)

දිනය :.........................

.................................................,
පළාත් ප්‍රධාන ලේකම්ගේ අත්සන.
නම :
නිල මුද්‍රාව :

09 - 262

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 01 ක් පිරවීම සඳහා වයඹ පළාතේ ස්ථිර පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශ්වයෙන්ම මාර්ගගතව (online) අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2026 නොවැම්බර් මාසයේ දී කුරුණෑගල නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ.

**1.0 අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :-**

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

*හෝ*

(2)

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් සහිත උපාධියක් ලබා තිබීම. **(මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව /තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය.)**

*සහ*

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

*හෝ*

(3)

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම.

*සහ*

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාද් උපාධියක් ලබා තිබීම.

*හෝ*

(4)

(i) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත (07) මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා තිබීම.

*සහ*

(ii) අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**_____සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

**02. වෙනත් සුදුසුකම් :-**

2.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු අතර, විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

2.2 සෑම අපේක්ෂකයකුම වයඹ පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි විය යුතුය.

2.3 අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට වයඹ පළාත තුළ පූර්වාසන්න වසර 03 ක කාලයක්වත් ස්ථිර පදිංචිව සිටි අයෙකු බවට ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් (DS 04 ග්‍රාම නිලධාරී සහතිකය) මඟින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පදිංචිය සනාථ කළ යුතුය.

2.4 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

2.5 තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

**3.0** වැටුප **:-** අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය MN 6 – 2025 වන අතර,මාසික වැටුප් පරිමාණය රු. 62,230 - 10 x 1190 - 11 x 1360 - 15 x 1670 - රු.114140/- ක් වේ. මේ අනුව, යථෝක්ත චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව වැටුප් ගෙවනු ලැබේ.

**04. සේවා කොන්දේසි:-**

4.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

4.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු/ඇය පරිවාස කාලය තුල සිය රාජකාරි වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් හා අනෙකුත් සේවය ස්ථිර කිරීම සඳහාවන අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

4.3 රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණ නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය.

4.4 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 03ක් ඇතුළත සේවයට බැඳුණ භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙකුත් රාජ්‍ය භාෂාව/ භාෂා පිළිබඳ ප්‍රවීණතාවය නියමිත මට්ටමට ලබා ගත යුතුය.

4.5 මෙම තනතුර සඳහා වන බඳවා ගැනීමේ / උසස් කිරීමේ පරිපාටියේ රෙගුලාසි හා ඒ අනුව පැවරෙන කාර්යභාරයට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලට ද වයඹ පළාත් කාර්ය පටිපාටික රීති, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහයට හා විනය කාර්යය සංග්‍රහයට ද දෙපාර්තමේන්තු නියෝග වලට ද වයඹ පළාත් සභා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා තනතුරු සඳහා වන සේවා ව්‍යවස්ථාවට ද රාජ්‍ය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි වලට හා නියෝග වලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම නිලධාරීන් බැඳී සිටී.

**5.0 ලිඛිත විභාගය :-**

(අ) මෙම විභාගය සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පැවැත්වේ. අයදුම්කරු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් යුක්ත වේ.

| ප්‍රශ්න පත්‍රය | මුළු ලකුණු | කාලය |
|---|---|---|
| (01) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 100 යි | පැය 02 |
| (02) අභියෝග්‍යතාව | 100 යි | පැය 01 |
| (03) සාමාන්‍ය බුද්ධිය | 100 යි | පැය 01 |

**සටහන:**

i. රාජකාරි කටයුතු සඳහා අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා හැකියා පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

ii. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන්ම අපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

**විභාග විෂය නිර්දේශය :-**

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය -** මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුවන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මූලධර්ම, පරිගණක නිර්මිතිය හා මෙහෙයුම් පද්ධති, මෘදුකාංග (වදන් සැකසුම, පැතුරුම්පත්, ඉදිරිපත් කිරීම්, දත්ත සමුදාය කළමනාකරණය සහ කාර්යාලවල භාවිත වන වෙනත් මෘදුකාංග පැකේජ) දෘඩාංග, දත්ත සන්නිවේදනය හා පරිගණක ජාල, අන්තර්ජාල, වෙබ් අඩවි නිර්මාණ සහ නව අන්තර්ජාල සේවාවන්, ඉලෙක්ට්‍රොනික තැපැල,තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති ජීවන චක්‍රය ආදී ක්ෂේත්‍ර වලින් දැනුම හා අධීක්ෂණ හැකියාව පරීක්ෂා කරනු ලබන ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

**අභියෝග්‍යතාව-** මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුවන්ගේ සංඛ්‍යා ලේඛනාත්මක හැකියාව සහ තර්කානුකූල කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වේ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න පනහකින් (50) සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

**සාමාන්‍ය බුද්ධිය -** සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර්සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

මෙම විභාගය තරග විභාගයක් වුව ද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක් බැගින් වත් (40%) අයදුම්කරුවන් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණන යටත් පිරිසෙයින් සියයට පනහක් (50%) වත් ලබා ගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනු පිළිවෙල තරයේ ම අනුගමනය කරමින් පත්වීම් ලබා දෙනු ලැබේ.

**6.0 විභාග ගාස්තු:-**

විභාග ගාස්තු වශයෙන් රු.1,200/- ක මුදලක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි වයඹ පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා තමා නමින් ලබා ගත් ව.ප.ස.මු.02 ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතු ය. ව.ප.ස.මු. 02 ආකෘතියේ ලදුපත හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හා මුදල් ඇණවුම් හෝ මුදල් කිසිවක් භාරගනු නො ලබන අතර එවැනි ලදුපත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට විභාගය සඳහා ඉදිරිපත් වීමට ඉඩ නොදෙන බව ද, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නො ගෙවන බව ද, එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බවද සැලකිය යුතුය. (මුදල් ගෙවූ ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම මතු ප්‍රයෝජනවත් විය හැක.)

**07. අයදුම් කිරීමේ ක්‍රමවේදය පහත පරිදි වේ.**

(අ) මෙම විභාගය සඳහා අයදුම්පත් කැඳවීම මාර්ගගත ක්‍රමය ඔස්සේ පමණක් සිදු කරනු ලැබේ. වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.exams.psc.nw.gov.lk දරන වෙබ් අඩවියට පිවිස එහි දක්වා ඇති උපදෙස් අනුව මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතුය.

(ආ) **මාර්ගගත අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2026.10.23 වේ.**

(ඇ) මාර්ගගත ක්‍රමය ඔස්සේ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත PDF ආකාරයෙන් බාගත කර, එය මුද්‍රණය කර, විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සිය අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත **2026.10.30** දිනට හෝ එදිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ තැපැල් කුරියර් සේවාව මඟින් එවිය යුතුය. (මුද්‍රිත පිටපතෙහි, ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.)

ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

අයදුම්පත බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව **"වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026"** ලෙස සඳහන් කළ යුතුය.

**08. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 71,240/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

**09.** මාර්ගගත අයදුම්පත්‍රය පිරවීමේ දී සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මුද්‍රිත පිටපත යොමු කළ පසු එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ ඇය වයඹ පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහකිරීමට පිළිවන.

**10. විභාගයට ඇතුළත් කර ගන්නා ක්‍රමය :**

මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත තොරතුරු සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද මාර්ගගත අයදුම්පත් හා මුද්‍රිත පිටපත ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විභාග ප්‍රවේශ පත්‍ර තැපෑලට නිකුත් කරනු ලැබේ. ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ (www.psc.nw.gov.lk) වෙබ් අඩවියේ නිවේදනයක් පළකරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර විභාග ප්‍රවේශපත්‍රය නොලැබුණි නම්, ඒ බව වහාම වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයට දැනුම් දිය යුතුය.

**11.** තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

**12. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :**

අපේක්ෂකයින් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලේඛනයකින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතුය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

*හෝ*

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය / වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේම තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**සටහන :**

**විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයකු අපොහොසත් වුවහොත් ඔහු /ඇය විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ.**

**13.** මෙම විභාගය පැවැත්වීම හෝ නො පැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම / නො කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් තීරණය කරනු ලැබේ.

**14.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එන්. එම්. ජේ. ප්‍රනාන්දු,**
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

09-244

---

මගේ අංකය : WPC/PSC/EXM/02.

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

## *බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ* III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2026 (II)

**විභාග ප්‍රතිඵල**

විභාගය පැවැත්වූ දිනය : **2026.07.26**

එක් එක් විෂයය සඳහා අවම වශයෙන් 40%ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අයදුම්කරුවන් විභාගය සමත් ලෙස සලකනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා නොපැමිණි අයදුම්කරුවන් (AB) සංකේතයෙන් දක්වා ඇත. එක් එක් විෂයය සඳහා අයදුම්කර නොමැති අයදුම්කරුවන් (----) සංකේතයෙන් දක්වා ඇත.

| අනු. අංකය | විභාග අංකය | මුලකුරු සමඟ නම | ජා.හැ. අංකය | මාධ්‍යය | කාර්යාල ක්‍රම | ගිණුම් ක්‍රම | පරිගණක පරීක්ෂණය |
|---|---|---|---|---|---|---|---|
| 1 | E 2600875 | එම්. එන්. ගමගේ | 998140080V | සිංහල | 53 | 40 | 57 |
| 2 | E 2600876 | අයි. එච්. ඩී. චන්ද්‍රකාන්ති | 968023942V | සිංහල | 64 | 10 | 44 |
| 3 | E 2600877 | ටී. එන්. ජී. පීරිස් | 961000440V | සිංහල | ---- | 48 | ---- |
| 4 | E 2600878 | පී. වී. ටී. දිව්‍යාංජලී | 958011032V | සිංහල | 39 | 41 | 50 |
| 5 | E 2600879 | පී. ඒ. එම්. ප්‍රනාන්දු | 956800617V | සිංහල | 51 | 12 | 40 |
| 6 | E 2600880 | එම්. සී. කේ. පෙරේරා | 946620424V | සිංහල | 51 | 30 | 52 |
| 7 | E 2600881 | එස්. ජේ. එම්. වයි. එස්. සමරකෝන් | 938083436V | සිංහල | ---- | ---- | 46 |
| 8 | E 2600882 | එම්. ඒ. එස්. එම්. ප්‍රනාන්දු | 936882960V | සිංහල | ---- | 24 | ---- |
| 9 | E 2600883 | එච්. ජී. ආර්. එන්. පෙරේරා | 935990467V | සිංහල | ---- | 45 | ---- |
| 10 | E 2600884 | ජී. එච්. එස්. පී. කුමාරි | 935911591V | සිංහල | ---- | AB | ---- |
| 11 | E 2600885 | එල්. යූ. ආර්. පෙරේරා | 935034124V | සිංහල | 61 | 33 | 47 |
| 12 | E 2600886 | එස්. ඒ. ඩී. බී. සඳමාලි | 928583589V | සිංහල | 64 | 35 | 56 |
| 13 | E 2600887 | බී. කේ. ඩී. මෙන්ඩිස් | 927950642V | සිංහල | ---- | 28 | ---- |
| 14 | E 2600888 | කේ. ඒ. එස්. නිලුක්ෂි | 918502831V | සිංහල | 62 | 32 | 40 |
| 15 | E 2600889 | එල්. ඩී. හෙට්ටිආරච්චි | 911951924V | සිංහල | 57 | 33 | 43 |
| 16 | E 2600890 | ජී. ඩබ්. අයි. පී. පෙරේරා | 906730367V | සිංහල | ---- | 49 | ---- |
| 17 | E 2600891 | ඩබ්. ඩී. වී. යූ. විමලවංශ | 888011684V | සිංහල | ---- | 67 | ---- |
| 18 | E 2600892 | යූ. එන්. ජී. පෙරේරා | 877170675V | සිංහල | 59 | 40 | 57 |
| 19 | E 2600893 | එම්. කේ. පී. සකුන්තලා | 875150057V | සිංහල | ---- | 54 | 40 |
| 20 | E 2600894 | ජී. එල්. එස්. රංගන | 870224125V | සිංහල | ---- | 42 | ---- |
| 21 | E 2600895 | ඒ. පී. ටී. වලනි | 857082982V | සිංහල | ---- | 59 | 35 |
| 22 | E 2600896 | කේ. පී. මනෝජිනී | 847111380V | සිංහල | 55 | 19 | ---- |
| 23 | E 2600897 | කේ. ජී. එම්. එන්. ජයතිලක | 845811490V | සිංහල | ---- | ---- | 36 |
| 24 | E 2600898 | ජී. ඒ. ආර්. එස්. ගල්බඩආරච්චි | 838403506V | සිංහල | AB | ---- | ---- |
| 25 | E 2600899 | ආර්. එම්. එල්. මධුවන්ති | 838252796V | සිංහල | ---- | 35 | ---- |
| 26 | E 2600900 | ඒ. එල්. ඒ. සංජීවනී | 836254066V | සිංහල | 68 | 46 | 54 |
| 27 | E 2600901 | පී. සී. එන්. පතිරත්න | 828583395V | සිංහල | ---- | 24 | ---- |
| 28 | E 2600902 | බී. එම්. ඩී. එදිරිසිංහ | 825560939V | සිංහල | ---- | 34 | 27 |
| 29 | E 2600903 | ජී. ටී. එස්. පෙරේරා | 816653266V | සිංහල | 57 | 23 | 50 |
| 30 | E 2600904 | එම්. පී. එස්. සුදසිංහ | 791810752V | සිංහල | ---- | 43 | ---- |
| 31 | E 2600905 | එච්. එම්. ඩී. එන්. හීන්කෙන්ද | 716060551V | සිංහල | 52 | 28 | 33 |
| 32 | E 2600906 | එම්. පී. පී. සෙනෙවිරත්න | 697242007V | සිංහල | AB | AB | AB |

| අනු. අංකය | විභාග අංකය | මුලකුරු සමඟ නම | ජා.හැ. අංකය | මාධ්‍යය | කාර්යාල ක්‍රම | ගිණුම් ක්‍රම | පරිගණක පරීක්ෂණය |
|---|---|---|---|---|---|---|---|
| 33 | E 2600907 | එච්. ඩබ්. ඩී. එන්. ප්‍රසන්න | 692791223V | සිංහල | ---- | AB | ---- |
| 34 | E 2600908 | කේ. ජී. ජේ. රාජපක්ෂ | 677330864V | සිංහල | ---- | ---- | 31 |
| 35 | E 2600909 | එස්. එම්. එන්. එච්. සෙනරත් | 199681104441 | සිංහල | ---- | AB | ---- |
| 36 | E 2600910 | ඩබ්. ඒ. ඩී. එන්. එරන්දි | 199352902980 | සිංහල | AB | AB | AB |
| 37 | E 2600911 | අයි. ඩී. එස්. ප්‍රනාන්දු | 199076800924 | සිංහල | ---- | 45 | ---- |
| 38 | E 2600912 | කේ. ටී. එල්. පෙරේරා | 198930400234 | සිංහල | 28 | 34 | 67 |
| 39 | E 2600913 | එච්. ඩී. ආර්. දිල්රුක්ෂි | 198862210041 | සිංහල | 66 | 50 | 49 |
| 40 | E 2600914 | යූ. ඩී. පද්මජා | 198856801913 | සිංහල | 66 | 47 | ---- |
| 41 | E 2600915 | කේ. එම්. ඩී. ඒ. රනිල් | 198417900758 | සිංහල | ---- | 45 | ---- |
| 42 | E 2600916 | ජී. එම්. සිල්වා | 198182604550 | සිංහල | 75 | 45 | 44 |
| 43 | E 2600917 | එම්. ඩී. එස්. කුරේ | 197973000896 | සිංහල | ---- | 25 | ---- |
| 44 | E 2600918 | එන්. එන්. රූපිකා | 197961700549 | සිංහල | 61 | 47 | 40 |
| 45 | E 2600919 | ජී. එන්. දේවිකා | 197864501728 | සිංහල | ---- | 48 | ---- |
| 46 | E 2600920 | එස්. ගමගේ | 197731602360 | සිංහල | ---- | 25 | ---- |
| 47 | E 2600921 | වයි. ඩී. මදනායක | 197374901595 | සිංහල | 46 | ---- | AB |
| 48 | E 2600922 | එම්. එෆ්. නස්ලිහා | 766210570V | Tamil | ---- | 31 | 40 |

තිලක් සෙනරත්,
ලේකම්,
බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

අංක 628, ජන ජය සිටි ගොඩනැගිල්ල,
නාවල පාර, රාජගිරිය.

09 - 272

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.